# ලංකා ලේලන්ඩ් ලිමිටඩ්

## லங்காலேலண்ட் லிமிடட்

## LANKA LEYLAND LIMITED

### 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 31 மார்ச் 2013 வருடமுடிவுக்கான

### YEAR ENDED 31ST MARCH 2013

## වාර්ෂික වාර්තාව

## வருடகுறிப்பக்கள்

## ANNUAL REPORT

# ලංකා ලේලන්ඩ් ලිමිටඩ්

## 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## වාර්ෂික වාර්තාව

**අධක්ෂක වරුන්ගේ වාර්තාව**

2013 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්තාව ඔබ වෙත පිලිගන්වන්නෙමි.

**ආයතනයේ ක්‍රියාකාරකම්**

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ අප විසින් විශාල ආයෝජනයක් සිදු කර ඇති ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගමේ මෙහෙයුම් කටයුතු අධික්ෂණය කිරීමයි.

**වසරේ විශ්ලේෂණය**

2013 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා

| | |
|---|---|
| ආදායම් | රු. |
| පොලී ආදායම | 7070,242.20 |
| පරිපාලන වියදම් | (1,658,738.40.00) |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභය/අලාභය | (532,248.750.00) |
| වෙනත් වියදම් | 2,540.69 |
| මෙහෙයුම් ලාභය/අලාභය | 526,839,786.49 |
| මූල්‍ය ආදායම් | 81,675,000 |
| බදු පෙර ලාභය/අලාභය | (445,164,786,89) |
| බදු වියදම් | (1,553,669.00) |
| බදු පසු ලාභය/අලාභය | 446,718,455.89 |
| වෙනත් විස්තීරණ ආදායම් | - |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | 446,718,455.89 |

**අධ්‍යක්ෂක මණ්ඩලය**

| | |
|---|---|
| වයි එල් එස් හමීඩ් මහතා | සභාපති |
| බී. එම්. රියාජ් මහතා | අධ්‍යක්ෂක |
| එස් ලියායුඩීන් මහතා | අධ්‍යක්ෂක |
| එස් ආනන්දරාසා | අධ්‍යක්ෂක |
| කේ. එම්. රිස්වි මහතා | අධ්‍යක්ෂක |
| නූර් නිසාම් මහතා | අධ්‍යක්ෂක |
| ඒ. එච්. එම්. අන්වර් මහතා | අධ්‍යක්ෂක |

**ලාභාංශ**

වර්ෂය සඳහා ලාභාංශ වශයෙන් රු. 80,000,000.00 ගෙවා ඇත.

**සමාගම සමඟ අධ්‍යක්ෂක මණ්ඩලය ඇති කරගන්නා ගිවිසුම්**

මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 17 හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගම සමඟ ඇති කර ගන්නා ගිවිසුම් දක්වා ඇත.

**විගණකවරු**

එම් එස් ක්‍රෙස්ටන් එම්. එන්. එස්. සහ සමාගම විසින් ගිණුම් විගණනය කරන ලදී. ඔවුන් ඊලඟ වර්ෂය සඳහා පත්වීමට කැමැත්ත පල කර ඇත.

අධ්‍යක්ෂක පරිදි,
අණ පරිදි
අත්සන් කළා

# ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමෙහි කොටස් හිමියන් වෙත ස්වාධීන විගණකගේ වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන, එනම් 2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පිටු අංක 02 සිට 16 දක්වා අන්තර්ගත වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක්ද වෙනත් පැහැදිලි කිරීම් වලින් සමන්විත සටහන් ද අප විසින් විගණනය කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වේ. මෙම වගකීමට අයත් වනුයේ, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර මනා පාලනය, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන වැරදි සහගත ප්‍රකාශන වලින් තොර බවට වග බලා ගැනීම, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම එම වගකීමට අයත් වේ.

## 3. විගණන විෂය පථය සහ මතය ප්‍රකාශ කිරීමේ පදනම

අපගේ විගණනය පවත්වාගෙන යන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. ඒ අනුව අදාළ මූල්‍ය වාර්තා වැරදි සහගත ප්‍රකාශ වලින් තොර බවට වග බලා සඳහා සහතික වන පරිදි අපෙන් විගණනය සැලසුම් කර පවත්වාගෙන යන ලදී. ඉහත සඳහන් මූල්‍ය වාර්තාවල ඇතුළත්, සංඛ්‍යා පැහැදිලි කිරීම් සහ අදාළ කරගත් ගිණුම් ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂවරුන් කර ඇති ඇස්තමේන්තු යනාදිය තහවුරු කර ගැනීම වස් අදාළ සාක්ෂි, පරීක්ෂණ පදනමක් යටතේ භාවිතා කළ අතර. මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළව පිළියෙල කර ඇත්දැයි යන්න පරීක්ෂා කරන ලදී. විගණන සඳහා අදාළ වේ යයි අප විශ්වාස කළ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබා ගන්නා ලදී. එම නිසා අප විසින් කරන ලද විගණනයන්, ප්‍රකාශිත මතය සඳහා ප්‍රමාණවත් බව අපගේ විශ්වාසයයි.

### මතය

අපගේ මතය අනුව, අපගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති අතර, ඊට අදාළ 2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත.

**කරුණක් අවධාරණය කිරීම**

අපගේ මතය තත්වාගණනය නොකර මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 04 කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ අනුව එහි සඳහන් භූමිය වර්තමානයේ සමාගම භාවිතයේ නැති බවට අප විසින් අවධාරණය කරන්නෙමු.

**අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව**

අපේ මතය අනුව මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 (2) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

ක්‍රෙස්ටන් එම් එන් ඒ එස් සහ සමාගම
වරලත් ගණකාධිකාරී
කොළඹ.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 31/03/2013 රු. | 31/03/2012 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4 | 634,452.00 | 629 306.00 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | 5 | 2,598,172,500.00 | 3,130,421,250.00 |
| | | 2,598,806,952.00 | 3,131,421,250.00 |
| **ජංගම වත්කම්** | | | |
| ආයෝජන | 6 | 58,954,171.79 | 56,869,404.13 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | | - | 65,550.00 |
| බැංකු මුදල් | 8 | 5,227,231.36 | 1,341,866.54 |
| | | 64,181,403.15 | 58,276,820.64 |
| මුළු වත්කම් | | 2,662,988,355.15 | 3,189,327,376,67 |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 9 | 8,958,600.00 | 8,958,600.00 |
| පොදු සංචිත | 10 | 9,800,924.00 | 9,800,924.00 |
| රඳවාගත් ලාභ | | 2,661,848,848.38 | 3,188,560 304.27 |
| | | 2,661,848,848.38 | 3,188,560,304.27 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 11 | 68,460.00 | 27,000.00 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 1,071,046.77 | 733,072.40 |
| | | 1,139,506.77 | 760,072.40 |
| මුළු ස්කන්ධය හා වගකීම් | | 2,664,288,355.15 | 3,189,327,376.87 |

**ඉහත මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කර ඇති බවට මම විසින් සහතික කරමි.**

..................................

මූල්‍ය පාලක

2013 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන (පෙර වර්ෂය ද ඇතුලුව) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

අධ්‍යක්ෂවරු.

7 ඔක්තෝම්බර් 2013.

සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 31/03/2013 | 31/03/2012 |
|---|---|---|---|
| **ආදායම්** | | රු. | රු. |
| පොලී ආදායම | | 7070,242.20 | 5,920,643.20 |
| පරිපාලන වියදම් | | (1,658,738.40.00) | (1,663,477.71) |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභය/අලාභය | | (532,248.750.00) | 331,993,750.00 |
| වෙනත් වියදම් | | 2,540.69 | 3,360.00 |
| මෙහෙයුම් ලාභය/අලාභය | | 526,839,786.49 | 336,247,555.49 |
| මූල්‍ය ආදායම් | 13 | 81,675,000 | 40,837,500 |
| බදු පෙර ලාභය/අලාභය | 14 | (445,164,786,89) | 377,085,055.49 |
| බදු වියදම් | 15 | (1,553,669.00) | (1,185,747.69) |
| බදු පසු ලාභය/අලාභය | | 446,718,455.89 | 375,899,307.80 |
| වෙනත් විස්තීරණ ආදායම් | | - | - |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | 446,718,455.89 | 375,899,307.80 |

## ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම
## 2013 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය.

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.) | පොදු සංචිතය (රු.) | රඳවාගත් ලාභය (රු) | එකතුව |
|---|---|---|---|---|
| 2011 අප්‍රේල් 1 දිනට ශේෂය | 8,958,600.00 | 9,800,924.00 | 2,832,939,842.48 | 2,851,699,366.48 |
| ලාභාංශ | - | - | (39,031,370.01) | (39,031,370.04) |
| | 8,959,600.00 | 9,800,924.00 | 2,793,908,482.42 | 2,812,667,996.47 |
| වර්ෂය සඳහා ලාභය | - | - | 375,899,307.80 | 375,899,307.80 |
| වර්ෂය සඳහා වන වෙනත් විස්තීරණ ආදායම් | - | - | - | - |
| වර්ෂය සඳහා වන සුළු විස්තීරණ ආදායම | | | 375,899,307.80 | 375,899,307.80 |
| 2012 මාර්තු 31 දිනට ශේෂය | 8,958,600.00 | 9,800,924.00 | 3,619,807,780.27 | 3,188,567,304.27 |
| ලාභාංශය | - | - | (80,000,000.00) | (80,000,000.00) |
| | | | (80,000,000.00) | (80,000,000.00) |
| වර්ෂය සඳහා වන අලාභය | - | - | (446,718,455.89) | (446,718,455.89) |
| වර්ෂය සඳහා වන වෙනත් විස්තීරණ ආදායම | - | - | - | - |
| ණය සඳහා වන මුලු විස්තීරණ ආදායම | | | (446,718,459.89) | (446,718,459.89) |
| 13 මාර්තු 31 දිනට ශේෂය | 8,958,600.00 | 9,800.824.00 | 2,643,089,324.38 | 2,661,848,848.38 |

සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| ආදායම | සටහන් | 31/03/2013<br>රු. | 31/03/2012<br>රු. |
|---|---|---|---|
| **අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | |
| බදු පෙර ලාභය/අලාභය | | (445,164,785.89) | 377,085,055.49 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය | 4 | 2,354.00 | 1,416.50 |
| පොලී ආදායම් | | (7,070,242.20) | (5,920,643.20) |
| ලාභාංශ ආදායම් | 13 | (81,675,000.00) | (40,837,500.00) |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභය/අලාභය | | 532,248,750.00 | (331,993,750.00) |
| මුළු ගැලපීම් | | 443,505,861.80 | (378,750,476.70) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ හි වෙනස්වීම් | | 65,550.00 | (65,550.00) |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හි වෙනස්වීම් | 11 | 41,460.00 | - |
| කාරක ප්‍රාග්ධනයෙහි මුලු වෙනස්වීම | | 107,010.00 | (65,550.00) |
| ආදායම් බදු ගෙවීම් | 12 | (1,215,694.63) | (1,734,498.50) |
| පොලී ලැබීම් | | 4,943,892.38 | 5,260,871.56 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රමාණය | | 2,176,282.66 | 1,794,401.05 |

| ආයෝජන ක්‍රියාකාරකම් | සටහන් | 31/03/2013<br>රු. | 31/03/2012<br>රු. |
|---|---|---|---|
| දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම් | 4 | (7,500) | - |
| ආයෝජන මිලදී ගැනීම | 6 | 41,582.16 | (4,952,157.08) |
| ලාභාංශ ලැබීම | 13 | 81,675,000.00 | 40,837,500.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | 81,709,082.16 | 35,885,342.92 |
| මූල්‍ය ක්‍රියාකාරකම් | | | |
| ලාභාංශ ගෙවීම් | | (80,000,000) | (39,031,370.01) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය | | (80,000,000) | (39,031,370.01) |
| මුදල් හා මුදල් සමාන දෑ හි වෙනස් වීම | | 3,865,364.82 | (1,351,625.24) |
| අප්‍රේල් 1 වන දිනට මුදල් හා මුදල් සමාන දෑ | 8 | 1,341,866.54 | 2,693,491.78 |
| මාර්තු 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | 8 | 5,227,231.36 | 1,341,866.54 |

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම**

**මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

**සටහන් අංක - 01**

**1. ආයතනික තොරතුරු**

සීමාසහිත ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ පිහිටුවා 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත සංස්ථාපනය කර ඇති අං 80/12 රබර්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ, යන ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති සීමිත පුද්ගලික සමාගමකි.

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ භාණ්ඩාගාර බිල්පත්වල සහ ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීමයි.

**සටහන් අංක - 02**

**1. පොදු තොරතුරු සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමේ වාර්තාව**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මෙය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්ට අදාලව සකස් කරන ලද පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලය වේ. (විස්තර සඳහා සටහන් අංක 19 බලන්න)

**3. ගිණුම්කරණ ප්‍රමිතිවල සාරාංශය**

**3.1 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සමස්ථ භාවිතය**

කාලච්ඡේදය අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත පරිදි සාරාංශ කර ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට අදාලව ශ්‍රී ලංකා ගිණුම්කරණ වාර්තා කරන ප්‍රමිතින් හා ගිණුම්කරණ ප්‍රමිතින්ගේ අදාල ව්‍යතිරේඛයන් හැර අනෙක් සෑම අවස්ථාවකදීම මෙම ගිණුම් ප්‍රතිපත්ති ඒකාකාරී කළමනාකරුවන් විසින් යොදා ගෙන ඇත.

**3.2 ආශ්‍රිත සමාගම්වල ආයෝජන**

සමාගම විසින් සිදු කර ඇති ආයෝජනයන්ගේ අගය මත එකී සමාගම්වල පාලනය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කල හැකි ආයෝජනයන් ආශ්‍රිත සමාගම්හි ආයෝජනයන් ලෙස ගිණුම්කරණය කර ඇති අතර බද්ධ ව්‍යාපාරය හා පරිපාලිත සමාගම්

මෙයට ඇතුලත් නොවේ. මෙම ආයෝජනයන්, සිදු කරන ලද ආයෝජනයේ පිරිවැයට පළමුව හඳුනාගෙන ඇති අතර ඉන්පසු ඒවායේ සාධාරණ අගයට ගිණුම්ගත කර ඇත.

## 3.3. ආදායම

පොලී ආදායම සහ ලාභාංශ ආදායම

පොලී ආදායම උපචිත පදනමින් හඳුනාගෙන ඇත. ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත්තේ ලාභාංශ ආදායම ලැබීමට අදාල හිමිකම ලැබීමෙන් පසුවය.

## 3.4 දේපල පිරියත උපකරණ

දේපල පිරියත උපකරණ සඳහා දැරූ පිරිවැයෙන් දැරූ පිරිවැයේ ඒවායේ සහ හානි කරන අලාභ අඩු කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපල පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ඒවායේ ඵලදායී ජීව කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.

| වත්කම් | වර්ෂය |
|---|---|
| කාර්යාල උපකරණ | 4 |

දේපල පිරියත උපකරණ ඒවායේ භාවිතය පටන්ගත් දිනයේ සිට භාවිතයෙන් ඉවත් කරන හෝ විකුණනු ලබන වාසිය තෙක් ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තියයි.

සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදීම ඵලදායී ජීවිත කාලය සහ සුන්බුන් අගය නැවත පරීක්ෂාකර අවශ්‍ය නම් ගැලපීම් සිදු කරයි.

## ගිණුම් ප්‍රතිපත්තියේ සමස්ථ භාවිතය

## 3.5 වත්කම්වන හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම්කරණ වර්ෂයකට වරක් වත්කම් හානිකරණය වී ඇති බවට කිසියම් හෝ පෙන්නුම් කිරීමක් සමාගමේ සිදු වී ඇත්දයි තක්සේරු කළ යුතුය. එවැනි හානිකරණ ලක්ෂණයන් පෙන්නුම් කරන විටදී හෝ සමාගම විසින් තීරණය කරන ලද වෙනත් අවස්ථාවකදී සමාගම විසින් තම දේපල, පිරියත හා උපකරණ වල නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කළ යුතුය. මෙහිදී වත්කම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහය වෙන වෙනම හඳුනා ගත නොහැකි නම් සමාගම විසින් එම වත්කම් අන්තර්ගත වන සමස්ථ ඒකකයම සලකා බලා වත්කමේ නැවත අයකර ගත හැකි අගය තීරණය කළ යුතු අතර, නැවත අයකරගත හැකි අගය ලෙස අදාළ වත්කමේ අනාගත භාවිතයෙන් ජනිත වන මුදල් ප්‍රවාහය වට්ටම් කර ලැබෙන අගය හා අදාළ වත්කමේ ධාරණ අගය යන දෙකෙන් වැඩි අගය ගත යුතුය. එසේ ගණනය කරන ලද නැවත අයකර ගත හැකි වත්කමේ ධාරණ අගය හා සැසඳිය යුතු අතර එම සැසඳීමේදී ධාරණ අගය වත්කමේ

නැවත අයකරගත හැකි අගයට වඩා වැඩි නම් එම වැඩි ප්‍රමාණය හානිකරණ අලාභය ලෙස සලකා කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට ලියාහල යුතුය.

හානිකරණයට ලක්වූ වත්කමක නැවත අයකර ගත හැකි සාධාරණව වැඩි වී ඇතැයි තක්සේරු කළ හැකි අවස්ථාවකදී පෙර වර්ෂයේ ලාභයට එරෙහිව කපාහළ හානිකරණ අලාභයට සමාන ප්‍රමාණයක් අදාළ කාලපරිච්ඡේදයේ ආදායමට මාරු කළ යුතුය.

## 3.6 මූල්‍ය උපකරණ

මූල්‍ය වත්කම්

මුදලි හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ඒවායේ ගනුදෙනු වටිනාකමට අගය කර ගිණුම්ගත කර ඇත.

අනෙකුත් කෙටි කාලීන මූල්‍ය වාර්තා

අනෙකුත් කෙටි කාලීන මූල්‍ය වත්කම් යන්නට ස්ථාවර තැන්පත් හි කරන ලද ආයෝජන හා භාණ්ඩාගාර බිල්පත් කරන ලද ආයෝජනයන් සමන්විත වේ.

මෙම වත්කම් ද පළමුව ගනුදෙනු වටිනාකමට ගිණුම් ගත කර ඇති අතර පසුව සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ක්‍රමකය කරන ලද පිරිවැයට වර්තා කර ඇත.

මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් යන්නට වෙළෙඳ හා අනෙකුත් වෙළෙඳ නොවන ජංගම බැරකම් අන්තර්ගත වන අතර පළමුව ඒවායේ ගනුදෙනු අගය මත ගිණුම්ගත කර ඇති අතර පසුව සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ මිනුම් කරන ලද පිරිවැය ගිණුම්ගත කර ඇත. මෙහිදී වෙළඳ ණයහිමියන් යන්නට සාමාන්‍ය ණය කාල සීමා යටතේ කරන ලද, පොලී අය නොකරන මූල්‍ය වගකීම් වේ.

## 3.7 ආදායම් බදු

කාලඡේදයට අදාල ආදායම් බද්ද ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර ආදායම් බදු සම්බන්ධයෙන් කිසිම ගැලපීමක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හෝ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ගලපා නැත.

කාලඡේදයේදී උපයන ලද ආදායම මත ගෙවිය යුතු/වැඩිපුර ගෙවූ හා පෙර වර්ෂවලට අදාල හිඟ හෝ අතිරික්ත බද්ද බදු වලින් ශේෂ පත්‍ර දිනට සමාගම සතුව පවතින බදු බැරකම හෝ වැඩිපුර ගෙවූ ආදායම් බදු ප්‍රමාණය පෙන්නුම් කරන අතර කාලඡේදයට අදාල බදු වියදම ආදායම් ප්‍රකාශයේ පෙන්නුම් කෙරේ.

## 3.8 ස්කන්ධය, සංචිත සහ ලාභාංශ ගෙවීම්

නිකුත් කල ඇති කොටස් මත මුදලින් ලද හෝ ඇරයුම් කල ඇති මුලු ප්‍රමාණය සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස ගිණුම් ගත කර ඇත.

සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන් සමාගම විසින් කලින් කලට ප්‍රකාශ කරනු ලබන ලාභාංශ ලැබීම සඳහා හිමිකම ලබන අතර එක් සාමාන්‍ය කොටසකට 1 එක ඡන්දය බැගින් හිමි වේ.

සමාගම ඈවර කිරීමේදී සමාගමේ සියලුම බැරකම් ගෙවීමෙන් පසු යම් අතිරික්තයක් වේ නම් ඒ සඳහා සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට එක හා සමාන අයිතිවාසිකමක් ඇත.

## 3.9 කෙටි කාලීන සේවක ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේදී ප්‍රතිලාභ

<u>සේවය අවසන් කිරීමේ සේවක ප්‍රතිලාභ</u>

සමාගමේ සේවකයන් සිය සේවය හමාර කිරීමේදී ගෙවිය යුතු හමාර කිරීමේදී ප්‍රතිලාභ සඳහා විවිධ දායකත්ව ක්‍රම සමාගම විසින් සිදු කරනු ලබයි.

නිර්ණය කරන ලද දායකත්ව සැලසුම, සේවකයන් සේවය හමාර කිරීමේදී ගෙවිය යුතු ප්‍රතිලාභ සඳහා සමාගම විසින් ක්‍රියාත්මක කරන සැලසුමක් මත වන අතර ඒ සඳහා සමාගම විසින් වෙනම ඒකකයක් පිහිටුවා ඇති අතර එයට අදාල දායක මුදල බැර කිරීම සිදු කරයි. තවද ඊට දායකත්ව මුදල් දරණ කාලච්ඡේදයේදී වියදමක් ලෙස ආදායම ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර දායක මුදල් වලින් ඔබ්බට විහිදුන නෛතික හෝ වෙනයම් බැදියාවක් නොමැත.

සේවකයාගේ ද දල පරිශ්‍රමිකනේ 12% 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සේවක භාරකාර අරමුදලට බාර කරයි.

<u>කෙටි කාලීන සේවක ප්‍රතිලාභ</u>

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ යන්නට සේවකයන් හා සම්බන්ධ උපචිත වැටුප් වේතන හා අනෙකුත් ආශ්‍රිත ප්‍රතිලාභ ඇතුලත් වන අතර ඒවා සමාගම විසින් ගෙවීමේදී පිටතට ගලා යන මුදල් ප්‍රමාණය මත වට්ටම් කිරීමකින් තොරව ගිණුම් ගතකර ඇත. එනම් ඒවායේ නාමික අගයට ගිණුම්ගත කර ඇත.

## 3.10 ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කිරීමේදී හා අවිනිශ්චිතතා තක්සේරුවේ දී කළමනාකාරිත්වය විසින් ගෙන ඇති විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනා ගැනීමට හා අගය කිරීම සඳහා කළමනාකණාකරය විසින් විවිධ ඇස්තමේන්තු විනිශ්චයන් හා උපකල්පනයන් යොදාගෙන ඇත.

<u>ප්‍රමාණාත්මක කළමණාකාරීත්වයේ විනිශ්චයන්</u>

පහත සඳහන් කළමනාකරණ විනිශ්චයන් මගින් මූල්‍ය ප්‍රකාශන මත සෘජු හා ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කරනු ලබයි.

<u>අවිනිශ්චිතතාව හා තක්සේරු කිරීම</u>

පහත සඳහන් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් අගය කිරීමේ දී හා හඳුනා ගැනීමේදී අදාළ ඇස්තමේන්තු හා උපකල්පනවලට අදාළ තොරතුරුවල සාධාරණත්වය ඉතා ඉහළ කාර්යභාරයක් සිදු කරයි. එසේ වුවද සත්‍ය ප්‍රතිඵල හා මෙම ඇස්තමේන්තුගත තොරතුරු අතර ප්‍රමාණාත්මක වෙනසක් තිබිය හැක.

<u>හානිකරණය</u>

හානිකරණ අලාභ ගණනය කිරීමේදී කළමනාකරණය විසින් යම් තනි වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක අනාගත මුදල් වට්ටම් කිරීම සඳහා පොලී අනුපාතයක් (වට්ටම් සාධකයක්) ඇස්තමේන්තු කළ යුතු අතර එමගින් එම වත්කමෙහි හෝ මුදල් උත්පාදනය ඒකකයේ අයකරගත හැකි අගය ගණනය කරනු ලබයි. මෙසේ ගණනය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහය හෝ වට්ටම් සාධකය ඇස්තමේන්තු කිරීමේදී අවිනිශ්චිතා තක්සේරු කිරීමක් සිදු කල යුතුය.

<u>ක්ෂය වන වත්කම්වල ඵලදායී ජීවිත කාලය ගණනය කිරීම</u>

සෑම ගිණුම් කාලච්ඡේදයක් තුලදීම කළමණාකාරීත්වය විසින් ක්ෂය වන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කළ යුතු අතර මෙහිදි යල් පැනයාම් යනාදිය පිළිබඳ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගත යුතුය.

සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන-04-දේපල පිරියත හා උපකරණ

| | සින්නක්කර ඉඩම් (රු.) | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|
| අප්‍රේල් 1 වන දිනට ශේෂය | 626,473.00 | 5 666.00 | 632 139.00 |
| වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | | 7 500.00 | 7 500.00 |
| මාර්තු 31 වන දිනට ශේෂය | 626,473.00 | 13,166.00 | 639,369.00 |
| උපචිත ක්ෂය සහ | | | |
| අප්‍රේල් 1 වන දිනට ශේෂය | - | 2,833.00 | 2,833.00 |
| වර්ෂය තුල ක්ෂය වීම් | - | 2,354.00 | 2,354.00 |
| මාර්තු 31 වන දිනට ශේෂය | - | 5,187.00 | 5,187.00 |
| අප්‍රේල් 1 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය | 626,473.00 | 2833.00 | 629,306.00 |
| මාර්තු 31 වන දිනට ඉදිරියට ගෙන ආ ශේෂය | 626,473.00 | 7,979.00 | 634,452.00 |

- වර්තමානයේ මෙම භූමිය සමාගම භාවිතයේ නොමැත.

සටහන් අංක 05 - ආශ්‍රිත සමාගමේ කර ඇති ආයෝජන

| | කොටස් සංඛ්‍යාව | 2013 % | 2012 % | 31/03/2013 (රු.) | 31/03/2012 (රු.) |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගම | 1,512,500 | 42% | 42% | 2,598,175,500.00 | 3.130.421.25 |
| | | | | 2,598,172,500.00 | 3,130,421,250.00 |
| ආශ්‍රිත සමාගමෙන් ලද ලාභාංශය (මූල්‍ය ආදායම් තුළ ඇතුලත් වේ) | | | | 81,675,000.00 | 40,837,500.00 |

ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සටහන් අංක 06 - ආයෝජන | 31/03/2013 | 31/03/2012 |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 32,500,000.00 | 27,500,000.00 |
| - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 23,892,788.82 | 21,773,697.34 |
| භාණ්ඩාගාර බිල්පත්-ලංකා බැංකුව | 2,561,382.97 | 2,595,706.79 |
| | 58,954,171.79 | 56,869,404.13 |

සටහන අංක - 07 - මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

| | | |
|---|---|---|
| මූල්‍ය වත්කම් | | |
| සාධාරණ අගයේ වෙනස්වීම ලාභලාභ ගිණුමේ ගලපන ලද මූල්‍ය වත්කම් | - | - |
| වත්කම් අගය තවත් වත්කමක් මත රඳා පවතින මූල්‍ය උපකරණ | - | - |
| වෙනත් කෙටි කාලීන මූල්‍ය වත්කම් | - | - |
| පිරිවැයෙන් හානිකරණ අලාභ අඩුකර දක්වා ඇති මූල්‍ය වත්කම් | - | - |
| වෙනත් දිගු කාලීන මූල්‍ය වත්කම් | - | - |
| එකතුව | - | - |

| | | |
|---|---|---|
| පිරිවැයෙන් ක්‍රමක්ෂය අඩුකර අගය කර ඇති මූල්‍ය වත්කම් | | |
| ආයෝජන - (සටහන් අංක 6) | 58,954,171.79 | 56,869,404.13 |
| බැංකු මුදල් - (සටහන් අංක 8) | 5,227,231.36 | 1,341,866.54 |
| | 14,181,403.15 | 58,211,270.67 |

| | | |
|---|---|---|
| මූල්‍ය වගකීම් | - | - |
| සාධාරණ අගය වෙනස් වීම ලාභලාභ ගිණුමේ ගලපන ලද මූල්‍ය වගකීම් | - | - |
| වත්කමේ අගයේ අගය තවත් වත්කමක් මත රඳා පවතින මූල්‍ය උපකරණ | - | - |
| එකතුව | - | - |

මූල්‍ය වගකීම්

| | | |
|---|---|---|
| වෙනත් ගෙවිය යුතු වියදම් - උපචිත වියදම් (සටහන 11) | 45,000 | 27,000 |
| එකතුව | 45,000 | 27,000 |

<u>සටහන අංක 8 - මුදල් හා මුදල් සමාන දෑ</u>

| | | |
|---|---|---|
| බැංකු මුදල් | 5,227,231.36 | 1,341,866.54 |
| | 5,227,231.36 | 1,341,866.54 |

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන් අංක 09- ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමට මුලින් ලැබුණ හෝ නොලැබුණු එහෙත් ඇරයුම් කල කොටස්වල වටිනාකම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත කර ඇත.

සමාගමේ කොටස් හිමියන්ට කලින් කලට අනුමත කරන පරිදි ලාභාංශ ලැබීමට හිමිකම් ලැබෙන අතර, එක් කොටස් හිමියෙකුට එක් ඡන්දයක් මගින් වාර්ෂික මහා සභා රැස්වීමකදී ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම හිමි වේ.

| | 31/03/2013 | 31/03/2012 |
|---|---|---|
| නිකුත් කල සහ ගෙවා නිමි කොටස් ප්‍රමාණය | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 2,150,000.00 | 2,150,000.00 |
| මාර්තු 31 දිනට ශේෂය | 2,150,000.00 | 2,150,000.00 |

**සටහන් - 10 - පොදු සංචිතය**

| | | |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 9,800,924.00 | 9,800,924.00 |
| මාර්තු 31 දිනට ශේෂය | 9,800,924.00 | 9,800,924.00 |

**සටහන් - 11 - වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**

| | | |
|---|---|---|
| මූල්‍ය වගකීම් | | |
| උපචිත වියදම් | 45 000.00 | 27 000.00 |
| | 45 000.00 | 27 000.00 |
| මූල්‍ය නොවන වගකීම් | | |
| උපචිත වියදම් | 23,460.00 | - |
| | 23,460.00 | 23,460.00 |

ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## සටහන් අංක - 12 - ආදායම් බදු වගකීම්

| | 31/03/2013 | 31/03/2012 |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 733,072.40 | 1,282,823.21 |
| වර්ෂය සඳහා වෙන් කිරීම | 1,553,669.00 | 1,226,462.00 |
| පෙර වර්ෂයේ අධි වෙන් කිරීම | - | (40,714,31) |
| | 2,286,741.40 | 2,468,570.90 |
| වර්ෂය තුළ කල ගෙවීම් | (733,072.00) | (1,242,108.90) |
| කල්පිත බදු බැර | (26,402.87) | (24,288.77) |
| රඳවා ගැනීමේ බදු | (456,219.76) | (468,100.83) |
| මාර්තු 31 දිනට ශේෂය | 1,071,046.77 | 733,072.40 |

## සටහන් අංක - 13 - මූල්‍ය ආදායම්

| | | |
|---|---|---|
| ආශ්‍රිතයන්ගෙන් ලාභාංශ ලැබීම් | 81,675,000.00 | 40,837,550.00 |
| මූල්‍ය ආදායම් | 81,675,000.00 | 40,837,550.00 |

## සටහන් අංක - 14 - බදු පෙර ලාභ/අලාභ

| | 31/03/2013 | 31/03/2012 |
|---|---|---|
| අධ්‍යක්ෂ දීමනා | - | 222,000.00 |
| අධ්‍යක්ෂ ගාස්තු | 272,400.00 | 321,040.00 |
| විගණන ගාස්තු - විගණනය සඳහා | 39,500.00 | 27,000.00 |
| පෙර වර්ෂය සඳහා ඌන වෙන් කිරීම | 7,272.00 | 3,845.00 |
| සේවක පිරිවැය | 204,000.00 | 204,000.00 |
| සේවක අර්ථසාධක හා භාරකාර දායකය | 108,600.00 | 124,350.00 |
| ක්ෂය වීම් | 2,354.00 | 1,416.30 |

ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

<u>සටහන් අංක -15</u>

ආදායම් බදු වියදම

15.1 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සඳහන් වන පරිදි සමාගම විසින් බදු අය වන ආදායමෙන් 28% ආදායම් බදු ලෙස වෙන් කොට ගෙවිය යුතුය

| | | |
|---|---|---|
| කාලච්ඡේදය සඳහා ආදායම් බදු | 1,553,669.00 | 1,226,462.00 |
| ආදායම් බදු අධි වෙන් කිරීම-පෙර වර්ෂය | - | (40,714.31) |
| | 1,553,669.00 | 1,187,747.69 |

15.2 බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය/අලාභය සැසඳීම

| | | |
|---|---|---|
| ආදායම් බදු සඳහා ගිණුම්කරණ ලාභය/අලාභය | (445,164,787) | 377,085,755 |
| අය කල හැකි ලාභය මත බදු බැදියාව | (124,646.40) | 105,583.15 |
| නිදහස් ආදායම මත බදු බැදියාව | (22,869,000) | (104,392.75) |
| ඉඩ නොදෙන වියදම් මත බදු බැදියාව | 149,069,509.00 | 35 397.00 |
| ඉඩ නොදෙන වියදම් මත බදු බැදියාව | (700) | - |
| පසුගිය වර්ෂය සඳහා ආදායම් හා අධි වෙන්කිරීම පෙර වර්ෂය | - | (40,714) |
| | 1,553,669 | 11185,748 |

15.3 ප්‍රමාණාත්මක තාවකාලික වෙනස්කම් නොමැති නිසා විලම්භිත බදු සඳහා වෙන් කිරීමක් කර නොමැත.

16. වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදුවන සිදුවීම්.

17. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු.

17.1 ඉහල කළමනාකරණයේ සමඟ ගනුදෙනු

ඉහල කළමනාකරණ පුද්ගලයින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතුලත් වේ.

ඉහළ කළමනාකරණ පුද්ගලයින් සඳහා ගෙවීම්

| | | |
|---|---|---|
| මාර්තු 31 දිනෙන් වසන්වර්ෂය සඳහා | 2013 (රු.) | 2012 (රු.) |
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 272,400.00 | 543,040.00 |

ඉහළ කළමනාකරුවන්ගේ පවුලේ සාමාජිකයන් සමඟ සිදුකරන ගනුදෙනු

ඉහළ කළමනාකරුවන් සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයන් සමග සිදුවූ ගනුදෙනු වර්ෂය තුල සිදුකර නොමැත.

ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(18) අසම්භාව්‍ය වත්කම් හා වගකීම්

2013 මාර්තු 31 දිනට අසම්භාව්‍ය වත්කම් හා වගකීම් කිසිවක් නොමැත.

(19) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට අදාළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ගේ භාවිතය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්ට අදාළව සකස් කරන ලද පළමු මූල්‍ය ප්‍රකාශ කට්ටලය මේ වන අතර මීට පෙර සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇත. සමාගම විසින් මූල්‍ය තත්ව විස්තරය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළව 1/4/2011 දිනට පිළියෙල කර ඇත. මින් හිමිකම් ලාභ හා මූල්‍ය ප්‍රකාශන භාවිතය මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වෙනස්වීමේ බලපෑම මෙම පරිච්ඡේදයේ විස්තර කර ඇති අතර අදාල සටහන්වලදී ද ඉදිරිපත් කර ඇත.

19.1 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අනුරූප තොරතුරු සන්සන්දනාත්මක දිනට හෝ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස් වන දිනට මූල්‍ය තත්වය ඉදිරිපත් කිරීමේදී සටහන් අංක 3 සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර එම ප්‍රතිපත්ති යොදා ගැනීමේදී පැනනගින ප්‍රතිඵල රඳවාගත් ලාභයට බැර හෝ හර කර ඇත.

19.2 හිමිකම් සැසඳීම

2012 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සුළු හා මධ්‍ය පරිමාණ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව හිමිකම් පහත පරිදි සැසඳිය හැක.

| | සටහන් | 31/03/2012 (රු.) | 01/04/2011 (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මුළු හිමිකම | | 76,021,084.27 | 71,146,866.48 |
| 2011/4/1 දිනට ආශ්‍රිත ආයෝජනයන්හි සාධාරණ අගය වෙන් කිරීම ලාභ/අලාභ | | 2,780,552,500.00 | - |
| ආශ්‍රිත ආයෝජනයන්හි සාධාරණ අගය වෙන් කිරීම ලාභ/අලාභ | | 331,993,750.00 | 2,780,552,500.00 |
| | | 3,112,546,250.00 | 2,780,552,500.00 |
| මුළු හිමිකම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අදාළව | | 3,188,567,304.27 | 2,851,699,366.48 |

ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

19.3 ලාභ අලාභ සැසඳීම

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 2012 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සුළු හා මධ්‍ය පරිමාන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව හිමිකම් පහත පරිදි සැසඳිය හැක.

| | සටහන | 2011/2012 |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ලාභාලාභ | | 43,905,557.80 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන යටතේ අගය වෙනස්වීම්හි ලාභාලාභ | (C) | 311,993,750.00 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අදාළව ලාභ හා අලාභ | | 375,899,307.80 |

19.4 මුදල් ප්‍රවාහය සැසඳීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට ගණුදෙනු වෙනස්වීමේදී මුදල් ප්‍රතිපත්තින්හි ප්‍රමාණාත්මක වෙනසක් නොමැත.

19.5 සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට අදාල මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන් විස්තර කිරීම සඳහා සටහන් නැවත වර්ගකරණය කිරීම

A. මූල්‍ය ආදායම්

ආදායම් යටතේ හඳුනාගෙන තිබූ කොටස් ආයෝජනයෙන් ලද ලාභාංශයන් සමාගම විසින් නැවත වර්ගීකරණය කර ඇත.

නැවත අගය කිරීම

B. භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ඒවායේ පිරිවැයටත් එම ආයෝජන මත ලැබිය යුතු ආදායම ලැබිය යුතු ආදායම් ලෙසත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගම විසින් හඳුනාගෙන තිබූ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අදාළව ඒවා පළමුව ස්ථාවර පිරිවැයටත් ඉන් පසුව සාධාරණ පිරිවැයටත් අගය කර ඇත.

C. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිරිවැය හඳුනාගෙන තිබූ ආශ්‍රිත සමාගම් හි ආයෝජන ඒවායේ සාධාරණ අගයට (වෙළඳපල) නැවත හඳුනාගෙන ඇති අතර ඒ අනුව 61,331,993,750.00 අතිරේක ආදායම් සාධාරණ අගයේ වෙනස්වීම ලෙස 2012 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා හඳුනාගෙන ඇත. තවද ගිණුම්කරණ වෙනස් වන දිනයේ දී රු. 2,780,552,500.00 ලාභයක් සාධාරණ අගය වෙනස්වීම ලෙස රඳවා ගත් ලාභයට බැර කර ඇත.